DFCC BANK
Keep Growing

පුද්ගලික ණය

මූලික කරුණු ලේඛනය

2019

පටුන

අංකය	මාතෘකාව	පිටු අංක.
1.	හැඳින්වීම	3
2.	පුද්ගලික ණයක් ලබා ගැනීම සඳහා යෝග්‍යතාව	3
3.	පුද්ගලික ණය කාණ්ඩ	3
4.	ආපසු ගෙවීම	4
5.	පොලිය සහ කොමිස්	4
6.	ගාස්තු සහ සෙසු අය කිරීම්	4
7.	අයදුම් කිරීමේ ක්‍රමවේදය	4
8.	අප අමතන්න	4

1. හැඳින්වීම

පුද්ගලික ණය DFCC පාරිභෝගික බැංකුකරණ කාණ්ඩයට අයත් ප්‍රසිද්ධ, වේගයෙන් ව්‍යාප්ත වන සේවයකි. එම ණය එක් එක් අයෙකුගේ පෞද්ගලික අවශ්‍යතා වලට අනුකූලව සකස් වන අතර එය දින දෙකක් ඇතුලත සියලු ලියකියවිලි සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ලබා දෙනු ඇත.

පුද්ගලික ණය ලබා දීමෙන් බැංකුව තම ප්‍රධාන සහ වැදගත් අභිප්‍රායන් වන පාරිභෝගික ණය කළඹෙහි වර්ධනය සහ ජංගම ගිණුම් සහ ඉතුරුම් ගිණුම් වල වර්ධනය ඉටුකර ගනී. වැටුප් හරහා ගෙවීම තුලින් **පුද්ගලික ණය බැංකුවේ** ජංගම ගිණුම් සහ ඉතුරුම් ගිණුම් වල වර්ධනය **සඳහා මූලික ලෙස දායක වනු ඇත.**

2. පුද්ගලික ණයක් ලබා ගැනීම සඳහා යෝග්‍යතාව

පුද්ගලික ණයක් ලබා ගැනීම සඳහා අවම යෝග්‍යතාව සපුරන රජයේ සහ පෞද්ගලික අංශයේ රැකියා නියුක්තිකයින්ට මෙන්ම ස්වයං රැකියාවන්හි නියුතු වෘත්තීයවේදීන්ට DFCC **පුද්ගලික ණය පිරිනමනු ලැබේ. තමන්ගේ ආදායම සහ** වෘත්තීයට අනුකූලව, පෞද්ගලික **අවශ්‍යතා** වලට සරිලන පරිදි පුලුල් සේවා පරාසයක් ඔවුනට අත්විදිය හැකිය.

යෝග්‍යතා නිර්ණායක:

I. උපරිම වයස අවුරුදු 55ක් දක්වා (සේවා දායකයාගේ තහවුරු කිරීම මත වයස අවුරුදු 60 තෙක්)
II. අපගේ වෙබ් අඩවියේ සඳහන් **පුද්ගලික ණය කාණ්ඩ වලට නියමිත** පරිදි සැලකිය හැකි සේවා කාලයක් සහිත ස්ථිර රැකියාවක් හෝ ස්වයං වෘත්තිමය ව්‍යාපාරයක නියුතු වෘත්තීයවේදීන්ට
III. රුපියල් 30,000/= අවම ආදායමක් (මූලික වැටුප + ස්ථිර දීමනා + අනියත දීමනා) හෝ ඊට වැඩි

3. පුද්ගලික ණය කාණ්ඩ

ශ්‍රීලංකාවේ පුරෝගාමී සංවර්ධන බැංකුව වන DFCC බැංකුව විසින්, පුද්ගලයින්ගේ **අවශ්‍යතා** සහ නැවත ගෙවීමේ හැකියාවට සරිලන පරිදි, පහත සඳහන් කාණ්ඩ යටතේ **පුද්ගලික ණය ලබා දෙනු ඇත.**

ණය සේවාව	**විස්තරය**
වෘත්තීය ණය	ස්ථිර හෝ ස්වයං වෘත්තිමය ව්‍යාපාරයක නියුතු වෘත්තීයවේදීන්ගේ **අවශ්‍යතා** සඳහා සැකසුණු විශේෂ ණය
GMOA ණය	රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයේ සාමාජිකයින් වෙනුවෙන් සැකසුණු විශේෂිත ණය
IESL ණය	ශ්‍රීලංකා ඉංජිනේරු ආයතනයේ සාමාජිකයින් වෙනුවෙන් සැකසුණු විශේෂිත ණය
Speed ණය	රජයේ සහ පෞද්ගලික අංශයේ රැකියා වල නියුතු විධායක නිලධාරින්ගේ **අවශ්‍යතා** සඳහා සැකසුණු ණය
වාහන බලපත්‍රලාභීන් සඳහා පුද්ගලික ණය	වාහන බලපත්‍රලාභීන් සඳහා වූ විශේෂිත ණය

Hiflex ණය	ඉහල ශුද්ධ වත්කමක් ඇති ස්ථිර ආදායම්ලාභීන් සඳහා අයිරා පහසුකම් සමඟ පුද්ගලික ණය

4. ආපසු ගෙවීම

අදාළ **ණය කාණ්ඩයට අනුකූලව** පුද්ගලික ණයක් වර්ශ 5ක් සිට 7ක් දක්වා උපරිම කාලයකට ලබා ගත හැකි අතර වයස අවුරුදු 60 තෙක් සම මාසික වාරික (ණය සහ පොලිය ස්ථාවර අගයක් වනු ඇත) මගින් ආපසු ගෙවීමට හැකිය.

5. පොලිය සහ කොමිස්

පුද්ගලික ණය සඳහා අදාළ පොලිය ඔබට අපගේ වෙබ් අඩවියෙන් ලබාගත හැකිය (www.dfcc.lk).

6. ගාස්තු සහ සෙසු අය කිරීම්

පුද්ගලික ණය සඳහා අදාළ ගාස්තු සහ සෙසු අය කිරීම් ඔබට අපගේ වෙබ් අඩවියෙන් ලබාගත හැකිය (www.dfcc.lk).

7. අයදුම් කිරීමේ ක්‍රමවේදය

පුද්ගලික **ණයක් සඳහා අයදුම් කිරීමට අපගේ වෙබ් අඩවියේ ඇති අයදුම් පත්‍රය පුරවා ඕනෑම DFCC බැංකු ශාඛාවකට බාර දිය හැකිය. එසේත් නැත්නම් අපගේ වෙබ් අඩවියේ ඇති විමසීම් පෝරමය පිරවිය හැකිය** (www.dfcc.lk).

තවද ඔබ කැමති ඕනෑම DFCC බැංකු ශාඛාවකට පිවිසීමෙන් ඔබට පුද්ගලික ණයක් සඳහා අයදුම් කල හැකිය.

පුද්ගලික **ණයක් සඳහා අයදුම් කිරීමට අවශ්‍ය ලේඛන අපගේ වෙබ් අඩවියේ සඳහන් කර ඇත.**

8. අප අමතන්න

ඔබට අපගේ 24 පැය ඇමතුම් මධ්‍යස්ථානය +94(11)2350000 ඔස්සේ අප ඇමතිය හැකි අතර, info@dfccbank.com මගින්ද අප සමඟ සම්බන්ධ විය හැකිය. තවද ඔබට අපගේ වෙබ් අඩවියේ සඳහන් ඕනෑම ශාඛාවකට පිවිසිය හැකිය.